**නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

# රැකියා අවස්ථා

ISO 9001:2015 ජාත්‍යන්තර තත්ව සහතිකයෙන් පිදුම්ලත් ප්‍රධාන පෙළේ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පහත සඳහන් තනතුරු සඳහා සුදුසකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමණාකරු (ප්‍රවාහන) 11 ශ්‍රේණිය

**සුදුසුකම්**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව/ තාක්ෂණික ඩිප්ලෝමාව (ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය)/ ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව/ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හැදෑරීමෙන් අනතුරුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක වසර 08 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මඟින් පවත්වනු ලබන පූර්ණ කාලීන මෝටර් රථ ඩිප්ලෝමාව හැදෑරීමෙන් අනතුරුව රජයේ සංසථාවක, මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක වසර 08 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

## 02. කළමණාකරු (ආරක්ෂක)11 ශ්‍රේණිය

**සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විශ්ව විද්‍යාලයක් මගින් ලබාගත් ප්‍රථම උපාධියකින් පසුව රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ අදාල ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

ආරක්ෂක සේවයේ මේජර් හෝ ඉහල තනතුරක වසර තුනක (03) සේවා පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | :- | රු. **53,175 - 10 x 1,375 - 15 x 1,910 - 95,575/=** |
| **වයස් සමාව** | :- | අවුරුදු 22 ත් - 45 ත් අතර විය යුතුය. |

**සියලුම ජීව දත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් හා තමා පිළිබඳ තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ පහත සඳහන් ලිපිනයට 2025.05.15 හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඉල්ලුම් කරන තනතුරෙහි නම අදාල ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරෙහි පැහැදිලිව සඳහන් කල යුතුය. අදාල අයදුම්පත්‍රය** www.landdevelopment.lk **වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත යුතු අතර, අදාල අයදුම්පත්‍රයට බාහිරින් එවන ලද අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන),**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.**

**රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක දැනටමත් සේවයෙ නයුතු අය තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර, අයදුම්කරු අදාල තනතුරට තෝරා ගතහොත් එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා අදාල ආයතනයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.**

*සභාපති*
*ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව*
*අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.*
*වෙබ් අඩවිය: www.landdevelopment.lk*